**SKY LINE TRAVELS (PVT) LTD.**

1st Floor, Jubilee Hall, St. Mary's Church, Grand Street, Negombo.

Contact: 031 2283555 / 0777 370 218 / 0777 797 428

info@skylinetravels.lk / www.skylinetravels.lk

IATA Accredited Agent


# ජුසේවාස් පිය හා වේලන්කන්නි ආරෝග්‍යා මාතා දේවස්ථානය ඇතුළු බොහෝ දේවස්ථාන වෙත සංවිධානය කෙරෙන අධ්‍යාත්මික චාරිකාව.

## පළමු දිනය

උදෑසන කටුනායක ගුවන් තොටුපොලින් පිටත් වී චෙන්නයි ගුවන්තොටුපල වෙත ළඟා වේ. උදෑසන ආහාරය ඉන් අනතුරුව චෙන්නායි ගුවන් තොටුපලෙන් පිටත් වී ගෝව ගුවන්තොටුපල වෙත පිටත් වීම. පසුව අප නවාතැන් ගන්නා ගෝව හෝටලය වෙත ළඟා වීම. ඉන් අනතුරුව ශු. ජුසේ වාස්තුමන්ගේ මව වන මරියා මිරෙන්ඩාගේ නිවස නැරඹීමට බෙනාලිම් වෙත පිටත්වීම. ශු. ජුසේවාස් පියතුමා උපන් ස්ථානය මෙය වේ. රාත්‍රී ආහාරය ගෙන හෝටලයේ නවාතැන් ගැනීම.

## දෙවන දිනය

උදෑසන ආහාරයෙන් පසු ඉන්දියාවේ අපෝස්තුළුවරයාණන් වන ශුද්ධ වූ ෆ්‍රැන්සිස් සේවියර් මුනිදුන්ගේ දේහය තැන්පත් කර ඇති ගෝව පැරණි නගරය වෙත ගමන් කිරිම ජේසුස් වහන්සේගේ ශාන්ත ෆ්‍රැන්සිස් සේවියර්තුමන් සහ ශාන්ත ජුසේ වාස්තුමන් පිළිබඳ නිරූපනය ආලෝක සහ ශබ්ද සංදර්ශනය නැරඹීමට අවස්ථාව ඇත. සිංහල භාෂාවෙන් සංවිධානය කරනු ලබන දිව්‍ය පූජා යාගයට සහභාගි වීම ශු. ෆ්‍රැන්සිස් සේවියර් මුනිදුන්ගේ නොදිරන ශරීරය දැක බලා ගැනීමට ඔබට අවස්ථාවක් ලැබෙනු ඇත. ඉන් අනතුරුව දිවා ආහාරයෙන් පසු ගොන්සාල් වෙස් පියතුමා උපත ලැබූ හා ජීවත් වූ දිවාරේ ගම්මානයට සංචාරය කිරීම, නැවත හෝටලය වෙත ගමන් කිරීම. රාත්‍රී ආහාරය සහ නවාතැන් ගැනීම හෝටලයේදී ය.

## තෙවන දිනය

උදෑසන ආහාරයෙන් පසු ශු. ජුසේවාස් පියතුමාගේ ළමා කාලයෙන් වැඩි කාලයක් ගත කළ Sanquelim හි පිහිටි ඔහුගේ පියාගේ නිවස බැහැ දැකීමට යාම. ඉන් අනතුරුව ශු. ජුසේවාස් පියතුමා රාත්‍රී කාලයේ පැමිණ යාච්ඤා කළ ශු. ෆිලිප් සහ ශු. ජේම්ස් දේවස්ථානය ද දැකබලා ගැනීම. රාත්‍රියේදී උන්වහන්සේ පැමිණි සෑම විටම දේවස්ථානයේ දොරවල් ඉබේම විවෘත වූ බව පැවසේ. ඉන් අනතුරුව උන්වහන්සේ තම ජීවිතය දේව මාතාවන්ට කැප කරන ලද ස්ථානයේ ඉදිකර ඇති දේවස්ථානය දැක බලා ගැනීම, දිවා ආහාරය. ඉන් අනතුරුව ගෝව ගුවන්තොටුපල වෙත පිටත් වීම. ගෝවා ගුවන්තොටුපළ සිට ට්‍රිචි ගුවන්තොටුපළ වෙත බලා පිටත් වීම්. රාත්‍රී ආහාරය ගෙන වේලන්කන්නි  බලා පිටත් වීම. වේලන්කන්නි අප නවාතැන් ගන්නා හෝටලය වෙත යාම.

## හතරවන දිනය

උදැසන ආහාරය ගෙන චෙන්නායි ජ්‍යාතන්තර ගුවන්තොටුපල වෙත පිටතේ වීම. ඉන් අනතුරුව මරි මවුන්ගේ පාදය ස්පර්ෂය ලැබූ වේලන්කන්නි ආරෝග්‍ය මාතා දේවස්ථානය වෙත පිටත් වීම. වේලන්කන්නි අප නවාතැන් ගන්නා හෝටලයට පැමිණිම. ඉන් අනතුරුව රාත්‍රි ආහාරය හොටලයෙන් ගැනිම සහනවාතැන් ගැනීම.

## පස්වන දිනය

උදෑසන ආහාරය ගෙන වේලන්කන්නි ආරෝග්‍ය මාතා ප්‍රධාන දේවස්ථානය වේත ගමන්කිරීම.දිව්‍යපූජාවට සහභාගි වීම. දිවා ආහාරය සදහා නැවත හොටලය වෙත ඒම. සවස් කාලය පෞද්ගලික යාඥාඥාවල නිරත වීම සදහා කාලය වෙන්කොට ඇත. රාත්‍රී ආහාරය හොටලයේන් ගැනීම සහ නවාතැන් ගැනීම

## හය දිනය

උදෑසන ආහාරය ගෙන Morning Star දේවස්ථානය හා මරිමව්න් කිරිගෙන යන දිළිදු දරුවාට දර්ශනය වූ ස්ථානය වෙත ගමන් කිරීම. පෞද්ගලික යාච්ඥාවල නිරත වීම හා නිදහස් කාලය. නැවත හෝටලයට පැමිණ දිවා ආහාරය ගැනීම, අනතුරුව නිදහස් කාලය. රාත්‍රී ආහාරය ගෙන චෙන්නායි බලා පිටත් වීම. චෙන්නායි හෝටලයට පැමිණීමෙන් පසු හෝටලයේ නවාතැන් ගැනීම.

## හත්වන දිනය

උදෑසන ආහාරය ගෙන ජේසුන් වහන්සේගේ ගෝලයන් දොළොස් දෙනාගෙන් එක් අයෙකු වන ආසියාවේ අපෝස්තුළුවරයා යන විරුදාවලිය ලත් ශුද්ධ වූ තෝමස් අපෝස්තුළුතුමන් ජීවත් වූ ගල් ගුහාව හා උන්වහන්සේ ප්‍රාතිහාරය සිදුකර ජලය ලබා ගත් ස්ථානය උන්වහන්සේගේ අත් හා පා සලකුණු සටහන් වූ ස්ථානය හා උන්වහන්සේ දිව්‍ය පූජා යාගය පැවැත් වූ ස්ථානයේ ඉදිකර ඇති ප්‍රාතිහාරයතත්මක රුධිරය වහනය වූ ගල් කුරුසිය නැරඹීම. ඉන් අනතුරුව ප්‍රාතිහාර්යාත්මක පත් වූ ස්ථානය එනම් St. Thomas Mount වෙත ගමන් කිරීම. එහිදී ද ඔබට ශුද්ධ වූ තෝමස් අපෝතුළුතුමා ඉන්දියාවට පැමිණෙන විට රැගෙන ආ ශුද්ධ වූ ලුක්තුමා විසින් අඳින ලද මරියතුමියගේ හා ජේසු බිළිඳුන්ගේ චිත්‍රයත් උන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද කුරුසියත් දැක බලා ගත හැකිය. ඉන්පසු ඔබව අප රැගෙන යන්නෙ ශුද්ධ වූ තෝමස් අපෝස්තුළුතුමන්ගේ ශරීරය තැන්පත් කළ ස්ථානයටයි. මෙම ස්ථානයේ වර්ථමානයේ ඉතා විශාල බැසිලිකා දෙව් මැදුරක් ඉදිකර ඇත. ජේසුස් වහන්සේගේ ගෝලයන් දොළොස් දෙනෙගෙන් වර්ථමානයේ ගෝලයින් තිදෙනෙකුගේ ශරීර තැන්පත් කර ඉදි කර තිබෙන බැසිලිකා දෙව් මැදුරු තුන අතරින් එකකි චෙන්නායි හි ශාන්ත තෝමස් බැසිලිකාව. මෙම ස්ථාන වන්දනා කර දැක බලා ගැනීමෙන් අනතුරුව පැමිණෙන්නේ ඔබට නිදහස් කාලයකි. ඉන් පසුව සාප්පු සවාරිය හා නිදහස කාලය. දිවා ආහාරය සහ සාප්පු සවාරියෙන් පසු නැවත පැමිණීම ඔබ විසින් සපයා ගත යුතුවේ. ඉන් පසුව රාත්‍රී ආහාරය ගෙන හෝටලයේ නවාතැන් ගැනීම.

## අට දිනය

උදෑසන ආහාරය ගැනීම. මෙදින සම්පූර්ණම දිනය ඔබට නිදහසේ සාප්පු සවාරියේ යෙදීම සඳහා වෙන්කර ඇති අතර, දිවා ආහාරය සහ සාප්පු සවාරියෙන් පසු නැවත පැමිණීම ඔබ විසින් සපයා ගත යුතු වේ. ඉන් පසුව රාත්‍රී ආහාරය ගෙන හෝටයේ නවාතැන් ගැනීම.

## නවය දිනය

චෙන්නායි සිට කොළඹ දක්වා පිටත්වන ගුවන් යානයෙන් දේවාශිර්වාදයෙන් පිරිණු සොඳුරු මතකයන් සමග අපගේ මව් බිම බලා පිටව් වීම. අප සියලු දෙනා අප මව් බිම වෙත ළඟා වීම හා අප විසින් වේලන්කන්නි ආරෝග්‍ය මාතා දේවස්ථානය හා ශාන්ත තෝමස් මුනිදුන්ගේ දේවස්ථාන වෙත සංවිධානය කරන ලද අධ්‍යාත්මික චාරිකාවේ අවසානය.

ජේසු පිහිටයි !

## චාරිකාවේ මිල ගණන්

| | | |
|---|---|---|
| කුඩා දරුවෙකු සඳහා | (අවු. 0 -2) | රු. 100,500.00 |
| පොඩි ළමයෙකු සඳහා | (අවු. 2 - 5) | රු. 210,500.00 |
| | (අවු. 6 - 12 | රු. 238,500.00 |
| වැඩිහිටියෙකු සඳහා | කාමරයක දෙදෙනෙකු හෝ තිදෙනෙකු | රු. 243,500.00 |
| | තනි කාමරයක් | රු. 317,500.00 |

රු. 150,000 ක් වන අත්තිකාරම මුදල ගෙවා ඔබගේ ආසනය වෙන්කරවා ගන්න.

## චාරිකාවේ ඇතුලත් දේ

- ගුවන් සමාගමේ ගුවන් ටිකට් පත්
- ගුවන් තොටුපොළ බදු මුදල්, ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ
- ඉන්දියානු වීසා
- වායුසමීකරණය ලද හෝටල් පහසුකම්
- වායුසමීකරණය කරන ලද වාහන මගින් ප්‍රවාහන පහසුකම්
- බුෆේ ක්‍රමයට ආහාර පහසුකම්

| | | | |
|---|---|---|---|
| 1. පළමු දිනය | රාත්‍රී | 6. හයවන දිනය | උදේ / දවල් / රාත්‍රී |
| 2. දෙවන දිනය | උදේ / දවල් / රාත්‍රී | 7. හත්වන දිනය | උදේ / රාත්‍රී |
| 3. තුන්වන දිනය | උදේ / දවල් / රාත්‍රී | 8. අටවන දිනය | උදේ / රාත්‍රී |
| 4. හතරවන දිනය | උදේ / දවල් / රාත්‍රී | 9. නවවන දිනය | පැමිණීම |
| 5. පස්වන දිනය | උදේ / දවල් / රාත්‍රී | | |

## චාරිකාවේ ඇතුළත් නොවන දේ

- බණ්ඩාරනායක ගුවන් තුටුපොල වෙත ගමන් පහසුකම් හා ආපසු බණ්ඩාරනායක ගුවන් තුටුපොලෙන් ගමන් පහසුකම්.
- ඔබ සතුව ගුවන් ටිකට්පතට ඇති ගමන් මලුවල බර අමතර බරක් බදු මුදල්.

විශේෂ දැනුවත් කිරීම

සෑම පුද්ගලයකුම රක්ෂණාවරනයක් ලබා ගැනීම අනිවාර්ය වේ. (Travel Insurance) තම වයස් සීමාවට අදාලව චාරිකාව සඳහා පුද්ගලිකව වුව ද තම රක්ෂණාවරණය ලබා ගෙන චාරිකාව හා සම්බන් ද විය හැකිය.